## හම්බන්තොට මහා නගර සභාව

## හම්බන්තොට දිස්ත්‍රික්කය.

01. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2011 නොවැම්බර් 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 ජනවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2013 මැයි 10 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , හම්බන්තොට මහා නගර සභාවේ 2011 නොවැම්බර් 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , නගරාධිපති වරයාට යවන ලද වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 නොවැම්බර් 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මහා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) හම්බන්තොට නගර සභාව මහා නගර සභාවක් බවට පත් කිරීමෙන් පසුව හම්බන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරන ලද රු. 68,002,818 ක වත්කම් සහ රු. 4,262,501 ක වගකීම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ගිණුම් කාලපරිච්ඡේදයට අදාලව සකස් කර තිබූ ශේෂ පිරික්සුමට වත්කම් හා වගකීම් ගිණුම් පමණක් ඇතුලත් කර තිබූ අතර ආදායම් හා වියදම් ගිණුම් ඇතුලත් කර නොතිබුණි.

(ඇ) මූලධන ආධාර (30381) ගිණුමට හා ආදායම් හා වියදම් ගිණුමට රු. 1,219,827 ක මුදලක් බැරකර තිබුණද ඒ සඳහා විස්තර දක්වමින් ජර්නල් සටහනක් තබා නොතිබුණි.

(ඇ) 2011 නොවැම්බර් 01 දිනට ලැබිය යුතුව තිබූ රු. 928,123 ක මුද්දර ගාස්තු ආදායම්, ප්‍රධාන ලෙජරයේ ආරම්භක ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණ අතර 2011 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාලව ලැබිය යුතව තිබූ මුද්දර ගාස්තු ආදායම් රු. 413,890 ක් ද මහා නගර සභා ගිණුම් කාල පරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු මුද්දර ගාස්තු ආදායම රු. 1,342,013 ක මුදලක්ද ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2011 යටතේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත වෙනුවෙන් 2011 දෙසැම්බර් 20 දින ලැබී තිබූ රු. 977,404 ක මුදල අදාල ගිණුම් කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(ඊ) මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2011 වර්ෂයේ ක්‍රියාත්මක කර 2012 වර්ෂයේ ගෙවීම් කරන ලද රු. 977,404 ක වියදම් අදාල ගිණුම් කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස සහ 2011 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

ගිණුම් විෂයයන් 24 කට අදාලව අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 57,711,666 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

02. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 නොවැම්බර් 01 සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මහා නගර සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු: 1,171,043 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.
----------------------

2.2.1 වරිපනම් බදු.
-------------

(අ) හම්බන්තොට නගර සභාව මහා නගර සභාවක් බවට පත්කිරීමෙන් අනතුරුව හම්බන්තොට ප්‍රාදේශීය සභාවට අයත්ව තිබූ කොහොලන්කල , සිරිබෝපුර , කැලියපුර , සාමෝදාගම සහ මිරිජ්ජවිල යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශයට අයත් වුවද , මහා නගර සභා ආඥා පනතේ 230(1) වගන්තිය අනුව එම ග්‍රාම නිලධාරී කොට්ඨාශවල වරිපනම් බදු තක්සේරු කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු මුදල රු. 1,672,465 ක් වූ අතර මෙම හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා මහා නගර ආඥා පනතේ 252(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.2.2 කඩකුලී.

2011 දෙසැම්බර් 31 දිනට කඩකාමර 33 කින් හිඟ කඩකාමර කුලී ලෙස රු. 239,450 ක් අයවීමට තිබූ අතර එම කුලී අයකර ගැනීමට මහා නගර සභා ආඥා පනතේ 253(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් උසාවි දඩ රු. 125,625 ක්ද මුද්දර ගාස්තු රු. 1,342,014 ක්ද 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණි.

2.3 නිෂ්ක්‍රිය භෞතික සම්පත්

යතුරු පැදියක් සහ ට්‍රැක්ටර් රථ 02 ක් ප්‍රයෝජනයට නොගෙන දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රියව පවතින අතර 2003 ජනවාරි 03 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ටෙන්ඩර් තැන්පත් , ආරක්ෂිත ඇප තැන්පත් , කර්මාන්ත රැඳවුම් හා මිශ්‍ර තැන්පත් වල එකතුව රු. 6,196,798 ක ශේෂයක් තිබුණි. කල් පසුවූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාර රාජ්‍ය ආදායමට ගැනීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහා නගර සභාව විසින් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක් සකස්කර නොතිබුණි.

2.5 අභ්‍යන්තර විගණනය

ආයතනයට අදාලව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක්ද සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලනයන්</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කලමනාකරණය
(ඈ) සේවක ණය පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය